# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 451 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 15/03/2024<br>පැය 0620 |

## මාධ්‍ය නිවේදනය

**අණ නොතකා ධාවනය කල ටිපර් රථයක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - ඔඩ්ඩුසුඩාන් පොලිස් ස්ථානය.**

2024.03.14 වන දින සවස් කාලයේ ධර්මපුරම් පොලිස් වසමේ ධර්මපුරම් ප්‍රදේශයේදී එම පොලිස් ස්ථානයට වාර්තා වී තිබූ කාර් රථයකට පහරදී අනර්ථය සිදුකිරීම, පොලිස් නිලධාරීන්ට සාපරාධී බලහත්කාරය පෑම හා විවෘත වරෙන්තු නිකුත් වී තිබූ සැකකරුවෙකු වැලි පටවාගත් ටිපර් රථයකින් ගමන් කරමින් සිටිනු දැක එය නවතා ගැනීමට පොලිස් නිලධාරීන් විසින් සංඥා කර ඇත. අණ නොතකා පලා යන සැකකරු පරන්තන් හරහා පුනරීන් දෙසට ධාවනය කර ඇති අතර ධර්මපුරම් පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් එම රථය පසුපස ලුහුබැඳ ගොස් ඇත. නොනවත්වා ධාවනය කළ සැකකරු අත්අඩංගුවට ගැනීමට නොහැකි වූ අතර ඒ සම්බන්ධයෙන් ධර්මපුරම් පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ජයපුරම් පොලිස් ස්ථානයේ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

මෙම සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා ජයපුරම් පොලිස් ස්ථානයේ නිලධාරීන් ටිපර් රථය පසුපස ලුහුබැඳ ගොස් ඇති අතර මොහු වෙල්ලාම්කුලම්, අක්කරායන්, මල්ලාවී, මාන්කුලම් හරහා ඔඩ්ඩුසුඩාන් දෙසට පලා ගොස් ඇත. ජයපුරම් පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් මේ සම්බන්ධව ඔඩ්ඩුසුඩාන් පොලිස් ස්ථානය දැනුවත් කිරීමටද කටයුතු කර ඇත. මෙම ටිපර් රථය ඔඩ්ඩුසුඩාන් පොලිස් මාර්ග බාධකයේදී රථය නැවැත්වීමට සංඥා කර ඇති අතර එයද නොතකා පලා යාම හේතුවෙන් මාර්ග බාධක රාජකාරී යෙදී සිටි ඔඩ්ඩුසුඩාන් පොලිස් නිලධාරීන් විසින් රථයේ ටයර් වලට වෙඩි තැබීමක් සිදුකර ඇත. එයද නොතකා පලාගිය ටිපර් රථය කිලෝමීටර් 06ක් පමණ දුරට ගොස් නතර කර එහි රියදුරු පලා යාමට උත්සහ කල අතර එහිදී සැකකරු පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21ක් වූ මුලියන්පොක්කනෙ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

වෙඩි තැබීම හේතුවෙන් කිසිවෙකුත් තුවාල ලබා නොමැති අතර සැකකාර රියදුරුගේ රියදුරු බලපත්‍රය අධිකරණය මගින් අත්හිටුවා ඇති බවටද විමර්ශන වලදී අනාවරණය වී ඇත.

සැකකරු සම්බන්ධයෙන් ඔඩ්ඩුසුඩාන් පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**